සැ. යු. - 2008.11.21 දින පළ වූ අංක 1,577 දරන ගැසට් පත්‍රයේ II හා III කොටස් පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,578- 2008 නොවැම්බර් මස 28 වැනි සිකුරාදා - 2008.11.28

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 1548 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 1550 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | 1551 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 1553 |
| විවිධ දැන්වීම් ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන *ගැසට්* නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු ගැසට් නිවේදන භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම්, පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙන සේ සකස් කරන මෙන් සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර - එනම් 2008 දෙසැම්බර් මස 05 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යා යුතු දැන්වීම් 2008 නොවැම්බර් මස 21 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2008 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### බේරුවල දිස්ත්‍රික් රෝහල, අළුත්ගම රෝහල හා දර්ගා නගරය පර්යන්ත ඒකකය යන රෝහල් සඳහා කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම - 2009 වර්ෂය

01. *ටෙන්ඩර් ඉදිරිපත් කල හැකි අය.-* 2009 ජනවාරි මස 01 දින සිට 2009 දෙසැම්බර් මස 31 දක්වා (එම දෙදිනද ඇතුළුව) කාලය තුල දී ඉහත සඳහන් රෝහල් 03 සඳහා කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ශ්‍රී ලාංකීය සමාගම් මගින් වෙන් වෙන්ව එවනු ලබන මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර කළුතර මහ රෝහලේ අධ්‍යක්‍ෂ විසින් භාර ගනු ලැබේ.

02. (1) *ටෙන්ඩර් තැන්පත් .-* මේ සමඟ ඇති උපලේඛනයේ දෙවන හා තුන්වන තීරුවල දක්වා ඇති මුදල් ප්‍රමාණයන් මෙම කාර්යාලයේ තැන්පත් කර එම මුදල් වෙනුවෙන් ලදුපතක් ලබා ගත යුතුය. තැන්පත් මුදලක් නොමැතිව ටෙන්ඩර් ආකෘති පත් ඉල්ලුම් කිරීමට විවිධ සේවා සමුපකාර සමිති වැනි ලියාපදිංචි සමුපකාර සමිති වලට පුළුවන. එම සමිති විසින් ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලුම්කරන විට ලියාපදිංචි අංකය ඉදිරිපත් කල යුතුය.

(ii) *ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීම.-* 2008.12.15 දින සවස 2.00 දක්වා මෙම කාර්යාලයෙන් ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. නියමිත ආකෘති පත්‍රයේ නොවන ටෙන්ඩර් සලකා බලනු නොලැබේ.

03. *වටිනාකම් පිළිබඳ තොරතුරු (වත්කම් විස්තර).-* සියළුම ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගන්නා අවස්ථාවේදී තම ස්ථිර පදිංචිය සනාථ කරන සහතිකයක් හා අදාල ප්‍රාදේශීය ලේකම්ගෙන් පොදු 170 ආකෘතිය මත ලබා ගත් වත්කම් සහතිකයක් ඉදිරිපත් කල යුතුය. වත්කම් සහතිකය බේරුවල රෝහල සම්බන්ධයෙන් රුපියල් පනස්දහසකට නොඅඩු (රු. 50,000.00) අළුත්ගම රෝහල සඳහා රුපියල් තිස්පන්දහසකට නොඅඩු (රු. 35,000.00) හා දර්ගා නගරය රෝහල සඳහා රුපියල් හතලිස් පන්දහසකට නොඅඩු (රු. 45,000.00) වටිනාකමකින් යුක්ත විය යුතුය. වත්කම් සහතික ඉදිරිපත් කිරීමට හා ස්වකීය මූල්‍යමය හැකියාවන් සනාථ කිරීමට නොහැකි වන කිසිවකුට ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු නොලැබේ.

04. ටෙන්ඩර් මණ්ඩලය මගින් තෝරා පත්කර ගත් ටෙන්ඩර් කරුවෙකුට ලියාපදිංචි තැපෑලෙන් ලිඛිතව දන්වා දින 14ක් ඇතුලත ඕනෑම බැංකුවකින් හෝ රක්‍ෂණ සමාගමකින් 2009 වාර්ෂික ඇස්තමේන්තු වටිනාකමින් සියයට දහයකට (10%) සමාන මුදලකට කාර්ය සාධන ඇපකරයක් කළුතර මහ රෝහලේ අධ්‍යක්‍ෂ නමින් ලබා ගත යුතුය. මෙම කාර්ය සාධන ඇපකරය 2009 ජනවාරි මස 01 දින සිට 2009.12.31 දින දක්වා වලංගු විය යුතුය.

05. (1) *සැපයිය යුතු ප්‍රමාණය.-* සැපයිය යුතු ප්‍රමාණයන් මේ සමඟ ඇති උපලේඛනයේ 6 වැනි තීරුවේ දක්වා ඇත.

(11) අළුත් මාළු, මස්, කරවල, බිත්තර හා එළවළු යනාදි සියළුම වර්ගවල ආහාර වේල් සඳහා ටෙන්ඩර්කරුවන් මිල ගණන් ඉදිරිපත් කළ යුතුය.

ආර්ථික වශයෙන් පිරිමැසුම්දායක පියවරක් වශයෙන් එක් ආහාරයක් වෙනුවට ආදේශක වෙනත් ආහාරයක් සැපයීම ගැන තීරණයක් ගැනීමට දෙපාර්තමේන්තුවට පුළුවන. උදාහරණයක් වශයෙන් ආර්ථික වශයෙන් පිරිමැසුම්දායක වන්නේ නම් බිත්තර කෑම වේලක් වෙනුවට මස් හෝ මාළු හෝ කරවල හෝ කෑම වේලක් ඇනවුම් කිරීමට පුළුවන. කෙසේ වෙතත් බිත්තර, මස්, මාළු හෝ කරවල කෑම වේලක් වෙනුවට එළවළු කෑම වේලක් ඇනවුම් කිරීමට නුපුළුවන. බිත්තර, මස් හෝ මාළු දිවා ආහාරය සඳහාද එළවළු කෑම රාත්‍රී ආහාරය සඳහා ද සැපයිය යුතු බව කොන්ත්‍රාත්කරුවන් සටහන් කර ගත යුතු අතර, ඒ ආකාරයට ආහාර සැපයීමට සූදානම් විය යුතුය.

06. *ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතු ආකාරය.-* සියළුම ටෙන්ඩර් පිටපත් දෙකකින් යුක්තව මුද්‍රා තබන ලද කවරයක බහා "අධ්‍යක්‍ෂ මහ රෝහල, කළුතර" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් එම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට අතින් ගෙනවිත් බහා ලිය හැකිය. මුද්‍රා තබන ලද කවරයේ උඩ වම් කෙලවරේ සැපයුම් ස්වභාවය සඳහන් කල යුතු අතර, පහල වම් කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය සඳහන් කළ යුතුය.

07. *ටෙන්ඩර් පත් භාර ගන්නා අවසාන දිනය.-* 2008.12.16 දින පෙ.ව. 10.00ට මෙම කාර්යාලයේ දී ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරනු ලැබේ.

08. *ටෙන්ඩර් පත් විවෘත කිරීම.-* ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරනු ලබන 2008.12.16 දින ටෙන්ඩර් භාර ගැනීම අවසන් වූ වහාම මෙම කාර්යාලයේ දී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරනු ලබන අවස්ථාවේ දී ටෙන්ඩර්කරුට පැමිණ සිටීමට පුළුවන. ටෙන්ඩර් ඉදිරිපත් කර ඇති අයගේ නම් සහ ඔවුන් විසින් ඉදිරිපත් කර ඇති මිල ගණන් පැමින සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේ දී කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩරයක් සම්බන්ධයෙන් කිසියම් පැහැදිලි කර ගැනීමක් අපේක්‍ෂා කරන ඕනෑම ටෙන්ඩර් කරුවකුට අධ්‍යක්‍ෂ හෝ අධ්‍යක්‍ෂ බලය පවරනු ලබන නිලධාරියකු සමඟ කලින් යොදා ගත් දිනයක අදාල ටෙන්ඩර් පත් පරීක්‍ෂා කර බැලීමට ඉඩ දෙනු ලැබේ.

09. *ටෙන්ඩර් තීරණය කිරීම.-* ලැබුණු ටෙන්ඩර් පත් වලින් සුදුසු ටෙන්ඩර්කරුවකු තෝරා ගැනීම තීරණය කිරීමේ දී පාදක කොට ගනු ලබන්නේ ආහාර වර්ග සඳහා ටෙන්ඩර් ආකෘති පත්‍රයේ "බී" උපලේඛනයේ ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කර ඇති මිල ගණන් මත මුළු වියදම ගණන් බැලීමෙනි. කෙසේ වෙතත් ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් ආකෘති පත්‍රයේ "සී" උපලේඛණයේ සඳහන් අමතර ආහාර සඳහා ද මිල ගණන් සඳහන් කල යුතුය. එහෙත් ගෙවීම් කරනු ලබන්නේ ටෙන්ඩරයේ සඳහන් කරන ලද මිල හෝ එවකට වෙළඳ පොළේ පවත්නා මිල යන දෙකෙන් අඩු මිල සඳහා වන අතර, ආහාර මිල පාලනය කර ඇති ද්‍රව්‍යයක් නම් පාලන මිල ගෙවනු ඇත.

10. *ටෙන්ඩර් මිල ගණන් වල වලංගුතාවය.-* ටෙන්ඩර්කරු විසින් සඳහන් කරනු ලබන මිල ගණන් ඉහත පළමුවන ඡේදයේ සඳහන් කාල සීමාව සඳහා වලංගු විය යුතු අතර, ගිවිසුම් පත්‍රයෙන් ඒ සඳහා එකී කාලය සංශෝධනය කිරීමට ඉඩ දෙනු නොලැබේ.

11. *ලංසු ඇපකරය -* ටෙන්ඩර්කරුවන් මේ සමඟ ඇති උපලේඛනයේ සඳහන් වන ලංසු ඇප මුදල ටෙන්ඩර් පෝර්ම සමඟ අමුණා තිබිය යුතුය. මෙම තැන්පත් මුදල රෝහලේ සරප් වෙත ගෙවා රිසිට් පත ලබා ගත හැකිය. ලංසු ඇප මුදල ඉදිරිපත් නොකරන ටෙන්ඩර් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

12. *ගබඩා පහසුකම්.-* තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරුගේ බඩු බාහිරාදිය ගබඩාකර ගැනීමට ආයතනය තුල හෝ ආයතනය පිහිටි භූමිය තුල ඉඩ කඩ ලබා දෙනු නොලැබේ.

13. *ටෙන්ඩර් කොන්දේසි.-* ටෙන්ඩර් ආකෘති පත්‍රයේ පසු පිටුවේ සඳහන් වන ටෙන්ඩර් කොන්දේසි සහ ගිවිසුම් පත්‍රයේ සඳහන් වන කොන්දේසි ටෙන්ඩර්කරුවන් වීමට අපේක්ෂා කරන සියළු දෙනා විසින් හොඳින් අධ්‍යයනය කොට එහි අවශ්‍යතාවයන් තරයේ අනුගමනය කළ යුතුය.

14. 1. ටෙන්ඩර්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද මිල ගණන් රෝගීන්ගේ එක ආහාර වේලකට නොපිසූ සහල් ග්‍රෑම් 100ක් (අවුන්ස 3 1/2) සහ සේවකයන්ගේ එක ආහාර වේලකට නොපිසූ සහල් ග්‍රෑම් 130 ක් (අවුන්ස 4 1/2) සැපයීම සඳහා විය යුතුය.

11. පරිත්‍යාග කරන ලද හෝ නොමිලේ සපයන ලද සහල් පිසීම සඳහා කොන්ත්‍රාත්කරුට සපයනු ලැබුවහොත් ඉන් සහල් වල වටිනාකමට සමාන මුදලක් කොන්ත්‍රාත්කරුගේ ගෙවීම් වවුචරයෙන් අඩුකර ගනු ලැබේ.

111. සේවකයන්ට බත් සමඟ අර්ධ ආහාර වේලක් සපයනු ලැබේ.

15. ආහාර ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමට ප්‍රවාහන පහසුකම් නොසපයන අතර, ආහාර ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම වෙනුවෙන් දරන්නට සිදුවන වියදම් ටෙන්ඩර්කරුවනට ගෙවනු නොලැබේ.

අධ්‍යක්‍ෂ,
මහ රෝහල,
කළුතර.

## උපලේඛනය

*අවශ්‍ය ආහාර වේල් සංඛ්‍යාව - 2009*

| *ආයතනය* | *ආපසු නොගෙවන ටෙන්ඩර් ආකෘති පත්‍ර ගාස්තුව රු. ශ.* | *ආපසු ගෙවන ටෙන්ඩර් ලංසු ඇපකරය රු. ශ.* | *සේවකයන් සඳහා ආහාර වේල් ගණන* | | | | | *රෝගීන් සඳහා ආහාර වේල් ගණන* | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | *අළුත් මාළු* | *මස්* | *කරවල* | *එළවළු* | *බිත්තර* | *අළුත් මාළු* | *මස්* | *කරවල* | *එළවළු* | *බිත්තර* |
| දිස්ත්‍රික් රෝහල බේරුවල | 100.00 | 3,500.00 | 1020 | 840 | 620 | 2400 | 700 | 420 | 420 | 420 | 20 | 1140 |
| ග්‍රාමීය රෝහල, අළුත්ගම | 100.00 | 3,500.00 | 600 | 660 | 600 | 1,680 | 460 | 225 | 240 | 300 | 300 | 420 |
| ග්‍රාමීය රෝහල, දර්ගා නගරය. | 100.00 | 3,500.00 | 600 | 720 | 600 | 1,800 | 660 | 520 | 600 | 600 | 700 | 1,500 |

11-491

# බඩු බාහිරාදිය විකිණීම්

**මහෙස්ත්‍රාත් අධිකරණය - මහියංගණය**

මහියංගණය මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලැබූ හා මෙතෙක් කිසිවෙක් හිමිකම් නොකියන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

01. මහියංගණය මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු වලට අදාලව රාජසන්තක කරනු ලැබූ හා මෙතෙක් කිසිවෙකු හිමිකම් නොකියන ලද පහත සඳහන් භාණ්ඩ 2008 දෙසැම්බර් මස 25 වැනි දින පෙ.ව. 10.00ට මහියංගණය මහේස්ත්‍රාත් අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි සඳහන් වන කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් හිමිකම් පාන්නෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු අතර, ඒ පිළිබඳව සලකා බැලීම සඳහා අදාළ භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කරනු ලැබේ.

03. අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගෙන් අවසරය ලබාගෙන වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට පමණ පෙර වෙන්දේසියට නියමිත භාණ්ඩ මහජනතාවට පරීක්ෂා කර බැලිය හැකිය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගැනෙන අවස්ථා වලදී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිළදී ගන්නා භාණ්ඩ භාර ගැනීමේදී හා මුදල් ගෙවීමේදී ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු අතර, භාණ්ඩ මිළදී ගැනීමට එන සෑම අයෙකුම තම ජාතික හැඳුනුම්පත රැගෙන ඒම අනිවාර්ය වේ.

06. සියලුම ගෙවීම් මුදලින් ගෙවිය යුතු අතර, මිළදී ගන්නා භාණ්ඩ වෙන්දේසිය පවත්වන දිනයේ ප.ව. 6.00 පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය.

ඩී. ඒ. ආර්. පතිරණ,
මහේස්ත්‍රාත් සහ අතිරේක දිසා විනිසුරු,
මහේස්ත්‍රාත් අධිකරණය,
මහියංගණය.

2008 නොවැම්බර් මස 05 වැනි දින,
මහියංගණය මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**උපලේඛනය**

| | | |
|---|---|---|
| 1. | 32940 | යකඩ මේස 01 |
| 2. | 45692 | යකඩ මේස 01 |
| 3. | 42677 | යකඩ මේස 01 |
| 4. | 45486 | යකඩ මේස 01 |
| 5. | 46145 | යකඩ මේස 01 |
| 6. | 42541 | යකඩ මේස 01 |
| 7. | 47629 | යකඩ මේස 01 |
| 8. | 47628 | යකඩ මේස 01 |
| 9. | 356571 | යකඩ මේස 01 |
| 10. | 60151 | යකඩ මේස 01 |
| 11. | බී. 323/07 | ලී බංකු 01 |
| 12. | 42676 | යකඩ මේස 01 |
| 13. | අංක ගිලිහී ඇති | යකඩ මේස 01 |
| 14. | අංක ගිලිහී ඇති | යකඩ මේස 01 |
| 15. | අංක ගිලිහී ඇති | යකඩ මේස 01 |
| 16. | අංක ගිලිහී ඇති | යකඩ මේස 01 |
| 17. | අංක ගිලිහී ඇති | යකඩ මේස 01 |
| 18. | අංක ගිලිහී ඇති | යකඩ මේස 01 |
| 19. | අංක ගිලිහී ඇති | සවල් 10, තාච්චු 10 |
| 20. | අංක ගිලිහී ඇති | සවල් 10, තාච්චු 10 |
| 21. | අංක ගිලිහී ඇති | සවල් 10, .තාච්චු 10 |
| 22. | අංක ගිලී ඇති | සවල් 10, තාච්චු 10 |
| 23. | අංක ගිලහී ඇති | සවල් 10, තාච්චු 10 |
| 24. | අංක ගිලහී ඇති | හරස් කියත් 03, උඩ යට ඉරන කියත් 02 |
| 25. | අංක ගිලිහී ඇති | හරස් කියත් 03, උඩ යට ඉරන කියත් 02 |
| 26. | අංක ගිලිහී ඇති | හරස් කියත් 03, උඩ යට ඉරන කියත් 02 |
| 27. | අංක ගිලහී ඇති | හරස් කියත් 02, උඩ යට ඉරන කියත් 01 |
| 28. | අංක ගිලිහී ඇති | බාල්දි 04 |
| 29. | අංක ගිලිහී ඇති | ඇලුමිනියම් කළ 01, මුට්ටි 01 |
| 30. | අංක ගිලිහී ඇති | ඇලුමිනියම් මුට්ටි 02 |
| 31. | අංක ගිලිහී ඇති | ඇලුමිනියම් සාස්පාන් 02 |
| 32. | 10927 | අගල් 1 රබර් බට අඩි 25 |
| 33. | 10927 | අබලන් පෙට්‍රල් මැක්ස් ලාම්පු 02 |
| 34. | 37345 | යාන්ත්‍රික කියත් 01 |
| 35. | අංක ගිලිහී ඇති | බාල්දි 03 |
| 36. | අංක ගිලිහී ඇති | තට්ටු තරාදි 04 |
| 37. | අංක ගිලිහී ඇති | තට්ටු තරාදි 03 |
| 38. | අංක ගිලිහී ඇති | තට්ටු තරාදි 03 |
| 39. | අංක ගිලිහී ඇති | බැලන්ස් (කුඩා) 01 |
| 40. | අංක ගිලිහී ඇති | බැලන්ස් 03 |
| 41. | අංක ගිලිහී ඇති | බැලන්ස් 03 |
| 42. | අංක ගිලිහී ඇති | බැලන්ස් 03 |
| 43. | අංක ගිලිහී ඇති | බැලන්ස් 04 |
| 44. | අංක ගිලිහී ඇති | ගෘහස්ථ තරාදි 01 |
| 45. | අංක ගිලිහී ඇති | බිම් තරාදි දඬු 02 |
| 46. | අංක ගිලිහී ඇති | කරඩි 01 |
| 47. | අංක ගිලිහී ඇති | විදුලි හීටර 01 |
| 48. | අංක ගිලිහී ඇති | තඹ කැබලි කි. ග්‍රෑ.15 |
| 49. | අංක ගිලිහී ඇති | යකඩ කැබලි තොගයක් |
| 50. | අංක ගිලිහි ඇති | ජංගම දුරකථන 02 |

11-468

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

## ප්‍රසිද්ධ දැන්වීම

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් ආඥාපනතේ 9 (1) ජේදය අනුව පහත සඳහන් සමාගම සීමාසහිත සමාගමක් ලෙස සංස්ථා ගත කළ බවට දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : සීමාසහිත සන්කෙම් ඉන්ජිනියරිං පුද්ගලික සමාගම
සමාගමේ ලියාපදිංචි අංකය : පී. වී. 65970
ලියාපදිංචි ලිපිනය : අංක 14/122, 123, 124 ඉහළ මහල, නිව් ටෙක්ස්ටයිල් ට්‍රේඩ් කම්ප්ලෙක්ස්, බේස්ලයින් පාර, බොරුල්ල, කොළඹ 08.

සමාගම් ලේකම්.

11-551

---

## දැන්වීමයි

'එච් ඇන්ඩ් එච් ට්‍රේඩිං (ඌවා) කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්', යන සමාගම, 2007 අංක 07 දරන නව සමාගම් පනත යටතේ 2008.10.08 දින අංක 65816 යටතේ ලියාපදිංචි කළ බවත් එහි ලියාපදිංචි කාර්යාලය අංක 135/3, 1/1, දුම්රියපොල පාර, උඩහමුල්ල, නුගේගොඩ යන ස්ථානයේ පිහිටා ඇති බවත් මෙයින් දැනුම් දෙමි.

11-524

---

## දැන්වීමයි

සීමාසහිත එදාස්

සීමාසහිත එදාස් (පුද්ගලික) සමාගම පී. වී. අංක 1632 2008 නොවැම්බර් මස 01 වැනි දින සිට පුද්ගලික සමාගමක් වීම නතර කර ඇති බව 2007 අංක 7 දරන සමාගම් පනතේ නියමයන් ප්‍රකාර මෙයින් දැනුම් දී සිටිනු ලැබේ.

සමාගම් ලේකම්,
සීමාසහිත එදාස්.

11-525

---

## දැන්වීමයි

සීමාසහිත සහස්

සීමාසහිත සහස් (පුද්ගලික) සමාගම 2008 නොවැම්බර් මස 01 වැනි දින සිට පුද්ගලික සමාගමක් වීම නතර කර ඇති බව 2007 අංක 7 දරන සමාගම් පනතේ නියමයන් ප්‍රකාර මෙයින් දැනුම් දී සිටිනු ලැබේ.

සමාගම් ලේකම්,
සීමාසහිත සහස්.

11-526

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

හාවාලිහි, තැ. පෙ. අංක 6087 හි පදිංචි මඩකලපුව මාමගම් කොලණියේ අංක 07 හි පදිංචිව සිටි බ්‍රිජට් ඇන්ජලා ජොබ්ස් වන ම විසින් නුවරඑළිය පොලිස් ස්ථාන පටුමගේ අංක 11 හි පදිංචිව සිටින ප්‍රෙඩ්රික් මන්සයි ජීවතරත්නම්ට ප්‍රදානය කර ඇති ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඩී. සී. ඩී. දයාසිරි ඉදිරිපිට දී ම විසින් අත්සන් තැබූ 2004 ජුනි 29 දිනැති විශේෂ ඇටෝර්නි බලපත්‍රය මෙදින සිට අවලංගු වී අහෝසි වී බල රහිත වන අතර එය තවදුරටත් බල නොපවත්වන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ එහි සියලු ජනතාව වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

බ්‍රිජට් ඇන්ජලා ජොබ්ස්.

11-595

---

## ප්‍රසිද්ධ නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය යටතේ සමාගමක් පහත සඳහන් පරිදි සංස්ථාගත කිරීම මෙයින් නිවේදනය කෙරේ :

සමාගමේ නම : වයබල් එක්සිම් ලංකා (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී. වී. 64526
දිනය : 2008.06.20
ලියාපදිංචි ලිපිනය : අංක 972/51, අන්නාසිවත්ත පාර, ඔරුවල

අධ්‍යක්ෂ,
කේ. ඒ. එල්. නානායක්කාර.

11-380

---

## 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාපනය කිරීමේ ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ වගන්ති 9 (1) ට අනුව සමාගමේ ලියාපදිංචි අංකය හා ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය දන්වන ප්‍රසිද්ධ දැන්වීම

සමාගමේ නම : ඒ. ආර්. කන්ස්ට්‍රක්ෂන් (පීවීටී) එල්ටීඩී
සමාගමේ ලියාපදිංචි අංකය : පී/වී. 65875
සංස්ථාපනය කළ දිනය : 2008.10.15
සමාගම ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 1012, නුවර පාර, අනුරාධපුර හන්දිය, ත්‍රිකුණාමලය.

සමාගමේ ලේකම්,
ජේ. ඇන්ඩ් ඒ මැනේජ්මන්ට් සිස්ටම්ස් පෞද්ගලික සමාගම.

අංක 96-2/7, කන්සිස්ටරි බිල්ඩිම, මල්වත්ත පාර, කොළඹ 11.
දුරකථන අංක : 011-4614887/011-4737315

11-489

**2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාපනය කිරීමේ ප්‍රසිද්ධ දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ වගන්ති 9 (1) ට අනුව සමාගමේ ලියාපදිංචි අංකය හා ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය දන්වන ප්‍රසිද්ධ දැන්වීම

සමාගමේ නම : ඕෂන් ෆුඩ්ස් ලංකා (පෞද්ගලික) සමාගම
සමාගමේ ලියාපදිංචි අංකය : පී/වී. 65939
සංස්ථාපනය කළ දිනය : 2008.10.22
සමාගම ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 1056, අළුත්කුරුව, පිටිපන, මීගමුව

සමාගමේ ලේකම්,
ජේ. ඇන්ඩ් ඒ මැනේජ්මන්ට් සිස්ටම්ස් පෞද්ගලික සමාගම.

අංක : 96-2/7, කන්සිස්ටරි බිල්ඩිම, මල්වත්ත පාර, කොළඹ 11.
දුරකථන අංක : 011-4614887/011-4737315

11-490

---

**දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියෙහි විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී :

සමාගමේ නම : සීමාසහිත මිරියබැද්ද ගම නැගුම ජනතා සමාගම
සමාගමේ ලියාපදිංචි අංකය : පී. බී. 3574
සංස්ථාපනය කළ දිනය : 2008 නොවැම්බර් 04
ලියාපදිංචි ලිපිනය : මිරියබැද්ද, පස්සර

සමාගමේ ලේකම්.

2008 නොවැම්බර් 10 වැනි දින දී ය.

11-494

---

**දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියෙහි විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී :

සමාගමේ නම : සීමාසහිත උඩගමගම නැගුම ජනතා සමාගම
සමාගමේ ලියාපදිංචි අංකය : පී. බී. 3576
සංස්ථාපනය කළ දිනය : 2008 නොවැම්බර් මස 04
ලියාපදිංචි ලිපිනය : උඩගම, පස්සර

සමාගමේ ලේකම්.

2008 නොවැම්බර් 10 වැනි දින දී ය.
11-495

**දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියෙහි විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී :

සමාගමේ නම : සීමාසහිත දඹේවෙල ගම නගුම ජනතා සමාගම
සමාගමේ ලියාපදිංචි අංකය : පී. බී. 3575
සංස්ථාපනය කළ දිනය : 2008 නොවැම්බර් 04
ලියාපදිංචි ලිපිනය : දඹේවෙල, පස්සර

සමාගමේ ලේකම්.

2008 නොවැම්බර් 10 වැනි දින දී ය.

11-496

---

**නිවේදනයයි**

පහත සඳහන් සමාගම 2008 ඔක්තෝබර් මස 15 වන දින සංස්ථාපනය කරන ලද බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වන වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : අෂ්විකා ( ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 65882
ලියාපදිංචි කාර්යාලය : 46, කේ සිරිල් සී. පෙරේරා මාවත, කොළඹ 13

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,

මැනේජ්මන්ට් ඇන්ඩ් බිස්නස් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
පී. වී. 259

සමාගමේ ලේකම්.

11- 482

---

**2007 අංක 07 දරන සමාගම් පනතේ 11 (5) වගන්තිය යටතේ කෙරෙන ප්‍රසිද්ධ දැන්වීම**

2007 අංක 07 දරන සමාගම් පනතේ 11 (3) වගන්තිය ප්‍රකාර සමාගමේ නම වෙනස් කර ඇති අතර පහත සඳහන් විස්තර අනුව එම පනතේ 8 (1) වගන්තිය ප්‍රකාර ලියාපදිංචිය සඳහා සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් වරයා වෙත ඉදිරිපත් කරනු ලබන බැව් මෙයින් දන්වමි.

සමාගමේ පැරණි නම : ටෙස් ඇග්‍රෝ ලිමිටඩ්
සමාගමේ අංකය : පී. බී. 689
සමාගමේ අළුත් නම : ටෙස් ඇග්‍රෝ පීඑල්සී

අධ්‍යක්ෂ,
ටෙස් ඇග්‍රෝ ලිමිටඩ්.

අංක 87, නව නුගේ පාර,
කැළණිය.

11-509

**සීමිත සමාගම් ඒකාබද්ධ කිරීමේ පොදු නිවේදනය**

සීඑම්ජ් - සී ජී එම් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් (සමාගම් අංක පීවී 5349) සී එන් සි ලයින් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් (සමාගම් අංක පීවී 62181)

සී එම් ඒ- සී ජී එම් ලංකා (ප්‍රයිවෙට්) ලිමිටඩ් (සමාගම් අංක පීවී 5349) සහ සී. එන් සී ලයින් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් (සමාගම් අංක පිවී 62181) යන සමාගම් ද්විත්වය, 2007, අංක 7 දරන සමාගම් පනතේ 242 ජේදයේ සඳහන් කොන්දේසි පරිදි තනි සමාගමක් ලෙස ඒකාබද්ධ කරනු ලබන බව, සමාගම් පනතේ 242 (3) බී ජේදය යටතේ මින් දැනුම් දෙනු ලැබේ.

ඒකාබද්ධ සමාගමේ නව නාමය සී එම් ඒ - සී ජී එම් ලංකා (ප්‍රයිවෙට්) ලිමිටඩ් වන අතර, මෙම ඒකාබද්ධ කිරීම වලංගු වන්නේ 2008 දෙසැම්බර් මස 10 වැනි දින හෝ සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් අනුමත කරන දිනයක දී විය හැක.

සී එම් ඒ - සී ජී එම් ලංකා (ප්‍රයිවෙට්) ලිමිටඩ් ලියාපදිංචි කාර්යාලය, අංක 400, ඩීන්ස් පාර, කොළඹ 10 හි පිහිටුවනු ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

හේලීස් ගෲප් සර්විසස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්,
ලේකම්වරු.

අංක 400, ඩීන්ස් පාර,
කොළඹ 10,
2008 නොවැම්බර් මස 06 වැනි දින.

11-516

---

**ප්‍රසිද්ධ නිවේදනයයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය යටතේ සමාගමක් පහත සඳහන් පරිදි සංස්ථාගත කිරීම මෙයින් නිවේදනය කෙරේ :

සමාගමේ නම : ග්ලෝබල් ඉන්ෆොටෙක් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී වී 64692
දිනය : 2008.07.03
ලියාපදිංචි ලිපිනය : අංක 532/45, මිගමු පාර, කපුවත්ත, ජාඇල.

ලේකම්,
එස්. ඩී. සී. ටී. කුලතුංග.
011-4959838

11-381

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**මහජන බැංකුව - මූලස්ථාන ශාඛාව**

පදිංචියට සුදුසු නිවාසමය දේපලක්

1968 අංක 32 දරන පනතින් හා 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ වෙන්දේසියේ විකිණීම

මත්තේගොඩ ගමේ පිහිටි මත්තේගොඩ වත්ත නැමැති ඉඩමෙන් පර්චස් විසි එකයි දශම හයයි හයක් (අ. 0 රූ. 0 පර්. 21.66) විශාල ඉඩම සහ නිවාස.

මහජන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2008.12.28 වැනි දින පෙ. ව. 11.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ දේපළ පිහිටි ස්ථානයේ දී විකුණනු ලැබේ.

*වැඩිවිස්තර සඳහා. - රජයේ ගැසට් පත්‍රයේ* 2007.04.12 වැනි දින ද, ඩේනිනිව්ස්, දිනමිණ සහ තිනකරන් පුවත්පත් වල 2007.04.03 වැනි දින ද පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපලට පිවිසීම.* -කොළඹ සිට කොට්ටාව නගරයට ගොස් එතැනින් දකුණට ඇති පාරේ කි. මී. 2ක් පමණ ගිය විට මත්තේගොඩ නිවාස යෝජනා ක්‍රමය හමුවේ. එම නිවාස යෝජනා ක්‍රමය බස් නැවතුම් පළ පසු කර මීටර් 100ක් පමණ ඉදිරියට යන විට දකුණු පසට ඊගල් නිවාස පාර හමුවේ. එම පාරේ දකුණු පස 2 වැනි නිවස වේ.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය :

1. ගැණුම් මිළෙන් 10%ක් ද,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිළෙන් 2 1/2%ක් ද ,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක් ද,
5. විකුණුම් වියදම සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිළෙන් ඉතිරි 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත කොළඹ 1, ආදිපාද වීදියේ, මහජන බැංකුවේ සහකාර සාමාන්‍යාධිකාරි (බටහිර කලාපය 1) වෙත ගෙවිය යුතුය.

දුරකථනන අංක : 2393678, 2387068 ෆැක්ස් අංකය : 2435977.

හිමිකම් සහ වෙනත් අදාල විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුලත නොගෙව්වහොත් දැනටමත් ගෙවා ඇති 10% ක මුදල ආපසු නොගෙවීමට හා නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්, බලයලත්,
වෙන්දේසිකරු සහ තක්සේරුකරු.
සාමදාන විනිශ්චයකාර (මුළු දිවයිනටම).

කාර්යාලය : අංක 25, බෙල්මන්ට් වීදිය, කොළඹ 12
දුරකථන අංකය : 011-5756356, 077-4372293.

නිවස : අංක 11/55, කුඩාබුත්ගමුව, අංගොඩ,
දුරකථන අංක : 011-2419126,

11-580

---

## මහජන බැංකුව - හයිඩ් පාර්ක් කෝනර් ශාඛාව

1986 අංක 32 දරන පනතින් හා 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ කොල්ලුපිටියේ සැන්ට් මයිකල් පාරේ පිහිටි අ. 0 රූ. 0 පර්චස් 2.62ක් විශාල ඉඩම සහ එහි තුළ පිහිටි සියළුම දේ මහජන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය මත මා විසින් 2008ක් වූ දෙසැම්බර් මස 27 වැනි දින පෙ. ව. 11.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි විස්තර සඳහා 2003.06.06 දින *රජයේ ගැසට් පත්‍රයේ ද,* 2003.05.28 වැනි දින දිනමිණ, ඬේලිනිව්ස් සහ තිනකරන් පුවත්පත් වල පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපලට පිවිසීම.* -කොළඹ සිට ගාලු පාරේ කොල්ලුපිටිය මංසන්ධියට ප්‍රථම වම් පසින් හමුවන ශාන්ත මයිකල් පාරේ වම් පසට හැරෙන වංගුවේ පිහිටි ගොඩනැගිල්ල වරිපනම් අංක 5, 7, 9 දරන දේපල.

*ගෙවීමේ ක්‍රමය.-*

1. ගැණුම් මිළෙන් 10%ක් ද,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිළෙන් 2 1/2%ක්ද ,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වෙතොත් එම මුදල්,
5. විකුණුම් වියදම සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිළෙන් ඉතිරි 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුලත කොළඹ 1, අංක 11, ආදිපාද වීදියේ, පිහිටි මහජන බැංකුවේ කලාප කාර්යාලයේ (බටහිර කලාපය 1) සහකාර සාමාන්‍යාධිකාරි වෙත ගෙවිය යුතුය.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක.

දුරකථන අංක : 2327843, 2393678 4-717008 2387068
ෆැක්ස් අංකය : 4 - 717009

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුලත නොගෙව්වහොත් දැනටමත් ගෙවා ඇති 10% ක මුදල ආපසු නොගෙවීමට හා නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්, බලයලත්,
වෙන්දේසිකරු සහ තක්සේරුකරු.
සාමදාන විනිශ්චයකාර (මුළු දිවයිනටම).

කාර්යාලය : අංක 25 බෙල්මන්ට් වීදිය, කොළඹ 12,
දුරකථන අංකය : 011-5756356, 077-4372293.

නිවස : අංක 11/55, කුඩාබුත්ගමුව, අංගොඩ,
දුරකථන අංක 011-2419126,

11-579

---

## මහජන බැංකුව-ලකී ප්ලාසා ශාඛාව

1986 අංක 32 දරන පනතින් හා 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයට අයත් හේවාගම් කෝරළයේ උඩුගහ පත්තුවේ ඉහල කොස්ගම පිහිටි බැරේගලලන්ද නැමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් අ. 0 රූ. 0 පර්. 20ක් විශාල ඉඩම සහ ඊට අයත් සියලුම දේ, මහජන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2008ක් වූ දෙසැම්බර් මස 14 වැනි දින පෙ. ව. 11.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ දේපල පිහිටි ස්ථානයේ දි විකුණනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 2008.10.03 දින ද, රජයේ පුවත්පත් වන දිනමිණ, ඬේලිනිව්ස් සහ තිනකරන් 2008.09.18 වැනි දින ද, පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපලට පිවිසීම*.-මහරගම සිට හයිලෙවල් පාර ඔස්සේ කොස්ගම දක්වා ගොස් වම්පසට ඇති වැලිහේන බෙරගල පාරේ කි. මී. 4ක් පමණ ගියවිට පුස්සැල්ලා සත්ව ගොවිපලට යාබද ව පාරේ දකුණුපස මෙම දේපල පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය :

1. ගැණුම් මිළෙන් 10%ක් ද, 2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක් ද, 3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිළෙන් 2 1/2%ක්ද , 4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක් ද, 5. විකුණුම් වියදම සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල 6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිළෙන් ඉතිරි 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත කොළඹ 1, අංක 11, ආදිපාද වීදියේ මහජන බැංකුවේ සහකාර සාමාන්‍යාධිකාරී වෙත ගෙවිය යුතුය.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක.

දුරකථනන අංක : 2393678 ෆැක්ස් අංකය : 2435977.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුලත නොගෙව්වහොත් දැනටමත් ගෙවා ඇති 10% ක මුදල ආපසු නොගෙවීමට හා නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්, බලයලත්,
වෙන්දේසිකරු සහ තක්සේරුකරු.
සාමදාන විනිශ්චයකාර (මුළු දිවයිනටම)

කාර්යාලය : අංක 25 බී, බෙල්මන්ට් වීදිය, කොළඹ 12.
දුරකථන අංකය : 011-5756356

නිවස : අංක 11/55, කුඩාබුත්ගමුව, අංගොඩ,
දුරකථන අංක 011-2419126,
077-4372293.

11-578

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධිත ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

මහනුවර, පේරාදෙණිය පාර, අංක 164 හි සීමාසහිත ටෙලි පික්ස් ටෙක්නෝලෝජීස් (පුද්) විසින් උකස් කරන ලද දේපල

ණය සීමා යොමු අංකය : 2273/06.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරනු ලැබ, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2008.08.22 දිනැති අංක 1564 දරන *ගැසට් පත්‍රයේ* හා 2008.08.14 දිනැති දිනමිණ, තිනකරන් හා ඩේලි නිව්ස් යන පුවත්පත් වල පළ කරන ලද යෝජනාවකට අනුකූලව මුල් මුදල් ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලිය, ගාස්තු හා එකී ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපල හා පරිශ්‍රය පිහිටි ස්ථානයේ දී 2009.01.21 වැනි දින පෙරවරු 11.30 ට මහනුවර, ටොරිංටන් පාර, අංක 24 හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

#### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර මහ නගර සභා සීමාව තුළ, කටුකැලේ පේරාදෙනිය පාර, දැනට සිරිමාවෝ බණ්ඩාරනායක මාවත හි පිහිටි, පෙර වරිපනම් අංක 102/103 ලෙස ද, වත්මන් වරිපනම් අංක 167/1, 167 හා 169 දරන දෙයියන්වල යයි හඳුන්වනු ලබන, උතුරට පේරාදෙණිය පාර, දැනට සිරිමාවෝ බණ්ඩාරනායක මාවත ද, නැගෙනහිරට : අන්දිරි වරකාඋල්ල පුංචිබණ්ඩා ගේ දේපල ද, දකුණට රජයේ ඉඩම ද, බස්නාහිරට : අන්දිරිස් හේනයා ගේ දේපල ද මායිම් වූ පර්චස් නමයයි දශම එකක (අක්. 0 රූ. 0 පර්. 9.1) ප්‍රමාණයෙන් යුත් ඉඩම් කොටස සියල්ල හා එහි තුළ පිහිටා ඇති ගොඩනැගිලි, පස්, ගස්, වැවිලි හා සෑම සියළු දේත් වේ. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ. 375/123 දරන පිටුවේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී ඉඩම හා ස්ථානය මනින ලදුව පහත සඳහන් පරිදි විස්තර කර ඇත :

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර මහ නගර සභා සීමාව තුළ, කටුකැලේ පිහිටි, බලයලත් මිනින්දෝරු, කේ. එම්. එච්. නවරත්න මයා විසින් සාදන ලද 1988 ඔක්තෝබර් මස 30 වැනි දිනැති අංක 51/82 දරන පිඹුරේ කැබලි 1 යනුවෙන් පෙන්නුම් කර ඇති, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත අංක 167 හා 169 යනුවෙන් විස්තර කරනු ලබන, ඊසාන දෙසට : සිරිමාවෝ බණ්ඩාරනායක මාවත අංක 165 දරන ස්ථානය ද, ගිණිකොට දෙසට, රජයේ ඉඩම ද, (මහනුවර ගුඩ්ෂෙඩ් බස් නැවතුම් පල) නිරිත දෙසට සිරිමාවෝ බණ්ඩාරනායක මත අංක 171 දරන ස්ථානය ද, වයඹ දෙසට : සිරිමාවෝ බණ්ඩාරනායක මාවත ද මායිම් වූ පර්චස් දහයක (අක්. 0 රූ. 0 පර්. 10) ප්‍රමාණයෙන් යුත්, එහි තුළ පිහිටා ඇති වරිපනම් අංක 167 හා 169 දරන ගොඩනැගිලි, සමග වූ, බෙදා වෙන් කරන ලද ඉඩම හා ස්ථානය වේ.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඊ. එම්. යූ. බණ්ඩාර,
ප්‍රධාන කළමනාකරු.

ලංකා බැංකුව,
අධිශ්‍රේණි ශාඛාව,
මහනුවර.

11-561

## හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - කොටහේන ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹට ප්‍රසිද්ධ නොතාරිස් එස්. එස්. හල්ඔලුව විසින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි නමට ලියා සහතික කරන ලද්දා වූ ද 2007.01.23 දිනැති සහ අංක 1890 දරන බැදුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම පකියසෝති අරවින්තන් යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපල 2008ක් වූ දෙසැම්බර් මස 17 වැනි දින පෙ. ව. 9.30 ට ඇරඹෙන පරිදි දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සහ මහ නගර සභා සීමාව තුළ මිලාගිරිය වසම් අංක 39 හි බම්බලපිටියේ පිහිටි ද ෆොන්සේකා පාර එපිට, ගෝමස් පාත් හි වරිපනම් අංක 5 ඒ දරන පරිශ්‍රය වන බලයලත් මානක ජී. බී. දොඩංගොඩ විසින් මැන සාදන ලද 2005.01.21 දිනැති සහ අංක 5298 දරන සභාධිපත්‍ය පිඹුරේ බිම් මහලේ ඒකක අංක 1 කොටස සහ ඒ සමග පොදු කොටස් වලින් 14.42%ක ප්‍රමාණයක් ද වේ.

විශාලත්වය : ව. මී. 94.394

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2008.10.31 දින දරන *රජයේ ගැසට් පත්‍රය* හා 2008.11.05 වැනි දින අයිලන්ඩ්, දිවයින, සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*-වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය :

1. ගැණුම් මුදලින් සියයට දහය (10%)ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%)ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%)ක් ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහක් (රු. 2,000) ක් ද,
5. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සියයි (රු. 500)ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් වේ.

ගැණුම් මුදලින් ඉතිරි 90%ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතුය. දින 30ක් ඇතුලත ඉතිරි මුදල නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාල ඔප්පු හා අදාල ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමණාකරු (ණය අයකිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10, දුරකථන අංක 2661826 ලබාගත හැක.

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුළු දිවයිනටම),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු,
හා බලයලත් වෙන්දේසිකරු.

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්,
මහානාම බ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ.

11-583/1

---

## හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. -පානදුර ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පානදුර ප්‍රසිද්ධ නොතාරිස් පී. වී. එන්. ඩබ්. පෙරේරා විසින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි නමට ලියා සහතික කරන ලද්දා වූ ද 2006.10.09 සහ 2007.05.17 දිනැති සහ පිළිවෙලින් අංක 1730 සහ 1958 දරන බැදුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ප්‍රෙස්ටිජ් ලංකා එන්ටර්ප්‍රයිසස් යන නාමය විලාශය සහ ව්‍යාපාරික නාමය යටතේ තනි පුද්ගල ව්‍යාපාරයක් පවත්වාගෙන යන පුබුදු ප්‍රසාද් රූපසිංහ යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල්, සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපල 2008ක් වූ දෙසැම්බර් මස 17 වැනි දින ප. ව. 3.30 ට ඇරඹෙන පරිදි දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුනේ, පානදුර ප්‍රාදේශීය සභා සීමාව තුළ පානදුර තල්පිටි දෙබැද්ද තන්තිරිමුල්ල උප කාර්යාල සීමාව තුළ හිරණ පිහිටි හිග්ගහවත්ත දරන ඉඩමට බලයලත් මානක බී. වී. එස්. ප්‍රනාන්දු විසින් මැන සාදන ලද 2001.06.02 දිනැති සහ අංක 1012 දරන ඉඩම් කොටස වේ.

විශාලත්වය : රූඩ් 2 යි පර්චස් 8

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2008.11.14 දින දරන *රජයේ ගැසට් පත්‍රය* හා 2008.11.17 වැනි දින අයිලන්ඩ්, දිවයින, සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*-වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%)ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%)ක් ද,

3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%)ක් ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහක් (රු. 2,000) ක් ද,
5. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සියය (රු. 500) ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් වේ.

ගැණුම් මුදලින් ඉතිරි 90%ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතුය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අදාළ ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමණාකරු (ණය අයකිරීම්), හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10, දුරකථන අංක : 2661826 ගෙන් ලබාගත හැක.

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුළු දිවයිනටම),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු,
හා බලයලත් වෙන්දේසිකරු.

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්,
මහානාම ඩ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ.

11-583/2

---

## හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - ගම්පහ ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. ඒකනායක විසින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි නමට ලියා සහතික කරන ලද්දා වූ ද 2006.08.24 දින සහ අංක 5643 දරන බැඳුම්කරය, යටතේ අයවිය යුතු මුදල් ගෙවීම එවග්‍රීන් හොටෙල් (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ 2008 ක් වූ දෙසැම්බර් මස 16 වැනි දින ප. ව. 3.30 ට ඇරඹෙන පරිදි දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, දාසිය පත්තුවේ, මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභා සීමාව තුළ, උඩුගහපොල, වල්පොල, 'අන්ඩිමුල්ල කුඹුර', නමැති ඉඩමට බලයලත් මානක එස්. ඩී. චන්ද්‍රතිලක විසින් මැන සාදන ලද අංක 4712 සහ 2005.05.21 දින දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන් කරන ලද ලොට් 1, 2, 4, 5, 6 සහ 7 ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස් වේ.

විශාලත්වය : ලොට් අංක 1 හි පර්චස් 15.45 යි,
ලොට් අංක 2 හි පර්චස් 30.9යි,
ලොට් අංක 4 හි පර්චස් 15යි,
ලොට් අංක 5 හි රූඩ් 2යි පර්චස් 19.90 යි,
ලොට් අංක 6 හි රූඩ් 2යි පර්චස් 2.85 යි,
ලොට් අංක 7 හි පර්චස් 33 යි.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2008.10.03 දින දරන රජයේ ගැසට් පත්‍රය හා 2008.10.23 වැනි දින අයිලන්ඩ්, දිවයින, සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*-වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය :

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%) ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%)ක් ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහක් (රු. 2,000) ක් ද,
5. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සියය (රු. 500) ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් වේ.

ගැණුම් මුදලින් ඉතිරි 90%ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතුය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අදාළ ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමණාකරු (ණය අයකිරීම්), හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10, දුරකථන අංක : 2661826 ගෙන් ලබාගත හැක.

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුළු දිවයිනටම),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු,
හා බලයලත් වෙන්දේසිකරු.

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්,
මහානාම ඩ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ,
දුරකථන අංකය : 2863121.

11-583/3

---

## හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. -දෙහිවල ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. සී. ජයවර්ධන විසින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි නමට ලියා සහතික කරන ලද්දා වූ ද 2006.07.18

දිනැති සහ අංක 2740 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම එම්. ජේ. ඇන්ඩ් එම්. එල්. ඉන්ජිනියරින් කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ 2008ක් වූ දෙසැම්බර් මස 19 වැනි දින ප. ව. 3.30 ට ඇරඹෙන පරිදි දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මුදලියාස් කොට්ඨාසයේ සල්පිටි කෝරළේ (නැදිමාල සහ නිකපෝ) දෙහිවල ගල්කිස්ස නගර සභා සීමාව තුළ, කොට්ඨාස අංක II නිකපෝ, නිකපෝ පාරේ, වරිපනම් අංක 39/12ඒ, බුළුගහවත්ත සහ කෝන්ගහවත්ත දරන ඉඩමට බලයලත් මානක කේ. ජී. ක්‍රිෂ්ණපිල්ලෙයි විසින් මැන සාදන ලද 2005.02.07 දිනැති සහ අංක 1292 දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස ලකුණු කරන ලද ඉඩම් කොටස වේ.

විශාලත්වය : පර්චස් 35.96.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2008.09.19 දින දරන *රජයේ ගැසට් පත්‍රය* හා 2008.10.07 වැනි දින අයිලන්ඩ්, දිවයින, සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය*.-වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය :

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%) ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%) ක් ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහසක් (රු. 2,000) ක් ද,
5. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සියය (රු. 500) ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් වේ.

ගැණුම් මුදලින් ඉතිරි 90%ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතුය. දින 30 ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අදාළ ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමණාකරු (ණය අයකිරීම්), හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී., අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10, දුරකථන අංකः 2661826 ගෙන් ලබාගත හැක.

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුළු දිවයිනටම),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු,
හා බලයලත් වෙන්දේසිකරු.

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්,
මහානාම ඩ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ.

11-583/4

## හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. -බොරැල්ල ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. සී. ජයවර්ධන විසින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි නමට ලියා සහතික කරන ලද්දා වූ ද 2006.06.29 දිනැති සහ අංක 2735 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම දිනෝෂා හෙට්ටිආරච්චි යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල්, සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ 2008ක් වූ දෙසැම්බර් මස 19 වැනි දින ප. ව. 12.30 ට ඇරඹෙන පරිදි දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ නාරාහේන්පිට, අංක 34 දරන වසමේ බොරැල්ලේ පිහිටි වෛද්‍ය එන්. එම්. පෙරේරා මාවත, (කලින් කොටා පාර) වරිපනම් අංක 280 දරන පෙලෙන්ගහවත්ත හෙවත් ගොරකගහවත්ත නමින් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක කේ. ඩී. ඩබ්. ඩී. පෙරේරා විසින් මැන සාදන ලද 2006.06.09 දිනැති සහ අංක 123/2006 දරන පිඹුරේ ලොට් අංක 1 දරන කොටස සහ ඒ සමග ගොඩනැගිලි සහ එහි පිහිටි අනෙකුත් සියලු දේත් වේ.

විශාලත්වය : පර්චස් 6.25.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2007.06.15 දින දරන *රජයේ ගැසට් පත්‍රය* හා 2008.11.18 වැනි දින අයිලන්ඩ්, දිවයින, සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය*.-වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය :

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%) ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%) ක් ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහසක් (රු. 2,000) ක් ද,
5. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සියය (රු. 500) ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් වේ.

ගැණුම් මුදලින් ඉතිරි 90%ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතුය. දින 30 ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අදාළ ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමණාකරු (ණය අයකිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී. එල්.

සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10, දුරකථන අංකය : 2661826 ගෙන් ලබාගත හැක.

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුළු දිවයිනටම),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු,
හා බලයලත් වෙන්දේසිකරු.

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්,
මහානාම ධ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ.

11-583/5

---

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. -පානදුර ශාඛාව**
**(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පානදුර ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. බී. එස්. ෆොන්සේකා විසින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි නමට ලියා සහතික කරන ලද්දාවූ ද 2000.09.05 දිනැති සහ අංක 3365 දරන බැඳුම්කරය සහ පානදුර ප්‍රසිද්ධ නොතාරිස් පී. වී. එන්. ඩබ්. පෙරේරා විසින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි නමට ලියා සහතික කරන ලද්දාවූ ද 2007.03.13 දිනැති සහ අංක 1895 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම රත්කොත් ජේඩිගේ වසන්ත රාජකරුණා යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල්, සියළු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ 2008 ක් වූ දෙසැම්බර් මස 17 වැනි දින ප. ව. 1.30 ට ඇරඹෙන පරිදි දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුනේ, වාද්දුව වස්කඩුව දෙබැද්දේ, කළුතර ප්‍රාදේශීය සභා සීමාව තුළ පිහිටි මොරන්තුඩුව උප කාර්යාලය සීමාව තුළ මාලෑගම පිහිටි මැලෑගම ස්ට්‍රේට් නමැති ඉඩමට බලයලත් මානක ඩී. ඒ. විජේසූරිය විසින් මැන සාදන ලද 1997.02.11 දිනැති සහ අංක 817 දරන පිඹුරේ ලොට් 171 බී ලෙස ලකුණු කරන ලද ඉඩම් කොටස වේ.

විශාලත්වය : පර්චස් 10. 1

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2008.09.19 දින දරන *රජයේ ගැසට් පත්‍රය* හා 2008.10.09 වැනි දින අයිලන්ඩ්, දිවයින, සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*-වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%) ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%) ක් ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහක් (රු. 2,000) ක් ද,
5. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සියය (රු. 500) ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් වේ.

ගැණුම් මුදලින් ඉතිරි 90%ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතුය. දින 30 ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අදාළ ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමණාකරු (ණය අයකිරීම්), හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10, දුරකථන අංකය : 2661826 ගෙන් ලබාගත හැක.

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුළු දිවයිනටම),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු,
හා බලයලත් වෙන්දේසිකරු.

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්,
මහානාම ධ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ.

11-583/6

---

**මහජන බැංකුව -අනුරාධපුර ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

අනුරාධපුර දිස්ත්‍රික්කයේ අනුරාධපුර නගරාසන්නයේ පොතානේගම ගමෙහි පිහිටි හෙක්. 0.1012 විශාල ඉඩම එහි පිහිටි නිවාස ගොඩනැගිලි මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2008 දෙසැම්බර් මස 18 වැනි දින පෙ. ව. 11.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ දී දේපළ පිහිටි ස්ථානයේ දී විකුණනු ලැබේ.

*දේපළ විස්තරය :*

*ඉඩම.*- උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ආදායම් කොට්ඨාසයේ පොතානේ ගම නමැති ගමෙහි පිහිටි ඉඩම හා නිවස.

*දේපළට පිවිසීම.* -අනුරාධපුර නව පුත්තලම් පාරේ, දෙකේ කණුව සිට කි. මී. 01ක් පමණ ඉදිරියට ගොස් සමරවීර සුපර් මාර්කට් දැන්වීම් පුවරුව ලඟින් වම් අතට තාර පාරේ කි. මී. 01 පමණ ගිය පසු වමට හමුවන දෙවැනි ගුරු පාරේ ගමන් කළ විට වම් අත පිහිටි තුන් වන ඉඩම් කට්ටිය.

*ගෙවීම් ක්‍රමය*.- වෙන්දේසිය අවසානයේ ගැනුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය :

1. ගැණුම් මිලෙන් 10% ක්,
2. ප්‍රාදේශීය සභා බදු වශයෙන් 1%ක්,
3. වෙන්දේසි කරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2.5%,
4. ලිපිකරු හා නිවේදන ගාස්තු රු. 500,
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. ගැණුම්කරු සඳහා දේපළ පැවරීමට අදාළ පැවරුම් ගාස්තු,
7. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත මහජන බැංකුව, අනුරාධපුර ශාඛාවේ කළමනාකාර වෙත ගෙවිය යුතුය.

දුරකථන විමසීම් - 025-2222593,
025-4580615,
025-2222500,
ෆැක්ස් : 025-2235855.

හිමිකම් ඔප්පු හා වෙනත් විස්තර සඳහා මහජන බැංකුවේ අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලයෙන් හෝ අනුරාධපුර ශාඛාවෙන් විමසන්න. ඉහත සඳහන් කරන ලද පරිදි මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් පළමු ගෙවීම වූ ගැණුම් මිලෙන් 10%ක් වූ මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ෂොක්මන් සහ සමරවික්‍රම,
ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම වරලත්
වෙන්දේසිකරුවෝ, (රාජ්‍ය හා පෞද්ගලික බැංකු කරුවන්
වෙනුවෙන් සහ උසාවි කෙමාසාරිස්වරු.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංක : 081-224371, 081-2227593,
දුරකථන/ෆැක්ස් අංක 081-2224371,
ඊමේල් : samera@diamond.lanka.net

*ප්‍රධාන කාර්යාලය :*
අංක 55 ඒ, ධර්මපාල මාවත,
කොළඹ 03,
දුරකථන අංකය : 011-2448526, 2575214,
ෆැක්ස් අංක : 2448526, 2575214
ඊමේල් : samera@srilanka.net.

11-510

---

### පෑන් ඒෂියා බෑන්කින් කෝපරේෂන් පීඑල්සී

### 1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 4 වැනි වගන්තිය යටතේ විකිණීම

#### වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ අධිකාරි පත්තුවේ පින්නමැද ග්‍රාමයේ පිහිටි බලයලත් මිනින්දෝරු සුගත් සමරවික්‍රම විසින් සකස් කරන ලද 2005 ජුනි මස 14 වැනි දින දරන පිඹුරුපත් අංක 116/2005 හි ලොට් අංක 51 B ලෙස සඳහන් 'රාණිමඩම එස්ටේට්' ලෙස හැඳින්වෙන සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද ඉඩම. ඉඩමේ ප්‍රමාණය අක් . 0, රූ.0, පර්. 12.65, එහි පිහිටි ගොඩනැගිල්ල සහ සියල්ල සහිතව

ප්‍රවේශ මාර්ගය.- මෙම ඉඩමට වත්තල නගරයේ සිට පැමිණීමට, වත්තල - හැඳල මංසන්ධියේ සිට හුණුපිටිය පාරේ කිලෝමීටර 5හේ කණුව දක්වා පැමිණ, එඬේරමුල්ල කඩවීදිය හා සුසාන භූමිය දක්වා පැමිණෙන්න. මෙම ඉඩම සුසාන භූමියට මුහුණලා පිහිටා ඇත. නුවර පාරේ මහර මංසන්ධියේ සිට (14 කණුව) කිලෝමීටර 1 - 1/4 දක්වා පැමිණි විට මෙම දේපළට ළඟා විය හැක.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් නීල් රාජකරුණා හේවාතන්ත්‍රී විසින් සහතික කරන ලද 2005 ජූලි මස 07 වැනි දින දරන අංක 802 සහ 2005 සැප්තැම්බර් මස 07 වැනි දින දරන අංක 836 උකස්කරයන් මත, සවාරි ඒජන්සීස් හි හවුල්කරුවන් වන සමරසිංහ ආරච්චිගේ සිසිර කුමාර පෙරේරා සහ බැද්දේ කංකානම්ගේ සරත් කුමාර යන අය විසින් පෑන් ඒෂියා බෑන්කින් කෝපරේෂන් පීඑල්සී (සීමාසහිත පෑන් ඒෂියා බෑන්ක් ලිමිටඩ් හා පෑන් ඒෂියා බෑන්කින් කෝපරේෂන් ලිමිටඩ් ලෙස හඳුන්වනු ලැබූ)ට උකස් කරන ලදුව, ගෙවීම් ඉටු කර නැත.

පෑන් ඒෂියා බෑන්කින් කෝපරේෂන් පීඑල්සී විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2008 දෙසැම්බර් මස 24 වැනි බදාදා දින පෙරවරු 11.00ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ගෙවීම් ක්‍රමය.- මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් මුදලින් ගෙවිය යුතුය :

1. ගැණුම් මිලෙන් 10% ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. ගැණුම් මිලෙන් වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාර),
4. රු. 90,000.00 කට නොඅඩු සම්පූර්ණ ප්‍රචාරක පිරිවැයෙන් 50% ක්,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500.00,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000.00.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ ඉතිරිය වෙන්දේසිය දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම සඳහා කරුණාකර 2008 සැප්තැම්බර් මස 19 වැනි දින සිලෝන් ඩේලි නිවුස්, ලක්බිම, සුඩර් ඔළි පුවත්පත් ද, *රජයේ ගැසට් පත්‍රය* ද බලන්න.

වැඩි විස්තර, ඔප්පු සහ වෙනත් අදාළ ලේඛන පරීක්ෂා කර බැලීමට සහ ලබා ගැනීමට කොළඹ 03, ගාලු පාරේ, අංක 450, සීමාසහිත පෑන් ඒෂියා බෑන්කින් කෝපරේෂන් PLC හි ජ්‍යෙෂ්ඨ කළමනාකරු - නීති අමතන්න.

දුරකථන අංක : 2565573, 2565565.

ෂොක්මන් සහ සමරවික්‍රම,
රජයේ අනුමත හා එකම ISO 9001 : 2000 සහතිකය ලත්,
ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ, පුරෝගාමී වරලත්
වෙන්දේසිකරුවෝ, උපදේශක තක්සේරුකරුවෝ
සහ ඉඩම් අලෙවි නියෝජිතයෝ.

*ප්‍රධාන කාර්යාලය :*
24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081-2227593,
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371,
ඊමේල් :schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
290, හැව්ලොක් පාර,
කොළඹ 05,
දුරකථන අංක : 011-2502680, 2585408,
දුරකථන/ෆැක්ස් අංකය : 011-2588176,
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.schokmanandsamerawickreme.com.

11-549

---

**පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පී එල් සී**

1990 අංක 04 දරන බැංකු විසින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසියක්

බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ 2008 දෙසැම්බර් මස 30 වැනි දින ප.ව. 3.00 ට දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරළේ අධිකාරි පත්තුවේ මහර දිස්ත්‍රික් ලේකම් කොට්ඨාසයේ (නාරංවල උපකාර්යාලය) මහර ප්‍රාදේශීය සභා සීමාව හි උඩුපිල පිහිටි උඩුපිල එස්ටේට් නම් ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ඩී. ජී. වීරසිංහ විසින් මැන සාදන ලද අංක 2213 සහ 2002.03.26 වැනි දින දරන පිඹුරෙහි (බලයලත් මිනින්දෝරු කේ. ඩී. ජී. වීරසිංහ විසින් මැන සාදන ලද අංක 2200 සහ 2002.03.04 වැනි දින දරන පිඹුරෙහි කැබලි අංක 1 සහ 2 හි ඒකාබද්ධ කිරීමක් සහ කොටස් බෙදා වෙන් කිරීමක් වන) කැබලි අංක 103 වශයෙන් බෙදා වෙන් කොට සීමා නිර්ණය කර ඇති එකී අංක 103 දරන බිම් කැබැල්ල ඊට අයත් ගොඩනැගිලි ගහකොළ ඇතුළු සියලු දේ වේ.

ප්‍රමාණය : අ. 0, රූ. 0,පර්. 13.24.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ආර්. දොලවත්තගේ විසින් සහතික කරන ලද අංක 2287 සහ 2007 පෙබරවාරි 09 වැනි දින දරන 2287 වන දරන බැඳුම්කරය මගින් සින්නයියා දේවගුරුනාදන් සහ මෙස්ට්‍රිගේ චමිලා නිශාන්ති සිල්වා යන ඒ ආර් ට්‍රේඩින්හි හවුල්කරුවන් විසින් උකස් කරන ලද දේපළ. යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2008.11.12 වැනි දින ලක්බිම, සුඩර් ඔලි, ඩේලි නිවුස් පුවත්පත් සහ 2008.11.21 වැනි දින *ගැසට් පත් ද* බලන්න.

*දේපළට පිවිසෙන මාර්ගය.*-කොළඹ සිට නුවර පාරේ මාකොළ මංසන්ධියෙන් (කිරිබත්ගොඩ හරහා) වමට හැරී මීටර් 200 ක් ගිය විට මීගහවත්ත පොලිස් ස්ථානය අසලින් වමට හැරී කිලෝමීටරයක් මාහේන පාරේ ගොස් දකුණට හැරී මීටර් 175 ක් ගොස් වමට හැරී මීටර් 30 ක් ගොස් දකුණට හැරී මීටර් 30 ක් පමණ ඉදිරියට ගිය විට අදාළ විකිණීමට ඇති දේපළ වම් පස පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලෙම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැණුම් මුදලින් 10% ක් ද,
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% සහ වැට් බද්ද ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් 2 1/2% ද, (සියයට දෙකහමාරක් පමණ),
4. විකිණීමේ සම්පූර්ණ ගාස්තුව හා අනෙකුත් ගාස්තු ද.

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30 ක් ඇතුළත ගැනුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතුය.

අදාළ ඔප්පු හ අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම හා වෙනත් අදාළ තොරතුරු, ජොෂ්ඨ කළමනාකරු නීති පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පී එල් සී ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර කොළඹ, 03 දුරකථන අංක : 2565573/2565565

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුළු දිවයිනටම),
උසාවි කොමසාරිස්,
තක්සේරුකරු හා බලයලත් වෙන්දේසිකරු.

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්,
මහානාම ඩ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ.
දුරකථන අංකය : 2863121.

11-548/1

---

**පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පී එල් සී**

1990 අංක 04 දරන බැංකු විසින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසියක්

බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ 2008 දෙසැම්බර් මස 30 වැනි දින ප.ව. 1.00 ට දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

